(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 160.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 ජුනි 26 සිකුරාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

193/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා මෙරටට බිත්තර ආනයනය කර තිබේද;

(ii) එසේ නම්, එම කාලය තුළ ආනයනය කළ බිත්තර ප්‍රමාණය සහ ඒ සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බිත්තර මිල ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

232/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් අගතියට පත්වන පාර්ශ්වයට සිය දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි 'විශේෂ පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන්වරයකු' පත් කිරීමට 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පොරොන්දුවී තිබේද;

(ii) එසේ නම්, එම පොරොන්දු ප්‍රකාරව පත් කර ඇති ඔම්බුඩ්ස්මන්වරයාගේ නම සහ කාර්යාල ලිපිනය කවරේද;

(iii) මෙතෙක් එම පත්කිරීම සිදුකර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

308/2024

ගරු රවී කරුණානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා —

(i) භාණ්ඩ අපනයන වටිනාකම සහ එමඟින් ලැබූ ආදායම;

(ii) භාණ්ඩ ආනයන වටිනාකම සහ ඒ සඳහා වියදම්;

(iii) වෙළඳ ශේෂය;

(iv) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අපනයන වටිනාකම;

ශ්‍රී ලංකා රුපියල් සහ ඇමරිකානු ඩොලර් මුදලින් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 වර්ෂයේ සිට මේ දක්වා —

(i) ප්‍රධාන කාණ්ඩ 10ක් දක්වමින් සේවා අංශයෙන් අපනයන ඉපැයීම්;

(ii) විදේශීය සේවාවන් සඳහා සිදුකළ ගෙවීම්වල වටිනාකම;

(iii) සේවා වෙළඳ ශේෂය;

(iv) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සේවා;

(v) ගෙවුම් ශේෂ අතිරික්තය හෝ හිඟය;

ශ්‍රී ලංකා රුපියල් සහ ඇමරිකානු ඩොලර් මුදලින් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගෙවුම් ශේෂ හිඟය වැඩිදියුණු කිරීම සඳහා ඉලක්ක කර ඇති ක්ෂේත්‍ර කවරේද;

(ii) (අ)(i) හි සඳහන් අපනයන අයිතම 15 කවරේද;

(iii) පසුගිය වර්ෂ 10 තුළ මෙරටට ගෙන්වා නොමැති, විදේශයන්හි රඳවාගෙන ඇති අපනයන ආදායමේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එලෙස මුදල් රඳවා ගැනීමට අවසරදී ඇති කාලසීමාව කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

599/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සාමාන්‍ය වෛද්‍යවරයෙකුට සහ විශේෂඥ වෛද්‍යවරයෙකුට රජය විසින් ගෙවනු ලබන මාසික වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රජයේ සේවයේ නියුතුව සිටියදී නිවාඩු ලබා හෝ සේවයෙන් ඉවත්වී මේ වන විට විදේශගතව සිටින සාමාන්‍ය වෛද්‍යවරුන් සහ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්ෂිකව විදේශගතවූ මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එලෙස විදේශගත වීමට බලපා ඇති හේතු කවරේද;

(v) මේ වනවිට විදේශගත වීම සඳහා ඉල්ලුම් කර ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(vi) වෛද්‍යවරුන්ගේ වැටුප් වැඩි කිරීම සඳහා රජය විසින් පියවර ගෙන තිබේද;

(vii) වෛද්‍යවරුන් රට හැර යෑම අවම කිරීම සඳහා වත්මන් රජය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

656/2025

ගරු රෝහණ බණ්ඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී මිලදී ගැනීමේදී වී අලෙවි මණ්ඩලය විසින් පසුගිය මහ කන්නයේදී සලකා බලන ලද නිර්ණායක හා නීති රීති කවරේද;

(ii) එම නිර්ණායක හා නීති රීති සම්බන්ධයෙන් ගොවි සංවිධාන එතරම් කැමැත්තක් නොදැක්වූ බව දන්නේද;

(iii) එසේ නම්, එම නිර්ණායක හා නීති රීති ඉදිරි කන්න සම්බන්ධයෙන් නැවත සමාලෝචනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

828/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිරි පස් වසරක පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්මක් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලැස්මට අනුව අනාගත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1217/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග අංක 155 (මට්ටක්කුලිය-ගල්කිස්ස) සහ මාර්ග අංක 140 (කොල්ලුපිටිය-වැල්ලම්පිටිය) යන මාර්ගවල පෞද්ගලික බස්රථ ධාවනය මේ වනවිට සම්පූර්ණයෙන්ම නැවතී ඇති බව දන්නේද;

(ii) මෙම මාර්ගවල ගමන් ගන්නා මගී ජනතාවගේ ප්‍රවාහන පහසුකම් සඳහා මේ වනවිට විකල්ප ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iv) කොළඹ මහා නගර සීමාව තුළ පොදු ප්‍රවාහන සේවය ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1634/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිවිධ හමුදාව තුළ ස්ථිර සහ තාවකාලික සේවයේ යෙදී සිටින හමුදා සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පසුගිය වසර 05 තුළ ඔවුන්ට නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත්වීම සඳහා පොදු සමා කාලයක් ලබා දුන් වාර ගණන කොපමණද;

(iii) එම පොදු සමා කාල තුළ නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත්වූ හමුදා සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1937/2026

ගරු අජිත් ගිහාන් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස සීනෝර් පදනම ස්ථාපිත කිරීමේ අරමුණ හා එහි කාර්යභාරය කවරේද;

(ii) එම පදනම විසින් පසුගිය පාලන කාලය තුළ ප්‍රමිතියෙන් යුතු දැල් හා බෝට්ටු නිෂ්පාදනය කිරීම, සාගර නිෂ්පාදන විකිණීම සහ අපනයනය කිරීම සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම කටයුතු සිදු කර ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය පාලන කාලය තුළ පදනමේ කාර්යභාරය බිඳ වැටී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(iii) පදනමේ මූල්‍ය වංචා සිදුවී තිබේද;

(iv) සී/ස සීනෝර් පදනම සංවර්ධනය කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2042/2026

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රක්නා ආරක්ෂක ලංකා සමාගම ආරම්භ කිරීමේ අරමුණ කවරේද;

(ii) 'රක්නා ආරක්ෂක ලංකා කුලුනු ව්‍යාපෘතිය' නමින් වාණිජ කාර්යාල සංකීර්ණයක් ඉදිකර තිබේද;

(iii) එසේ නම්, ආරම්භ කළ වර්ෂය සහ අනුමැතිය ලබා දුන් පුද්ගලයන් කවුරුන්ද;

(iv) ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කර ඇති මුදල, ආයෝජන ක්ෂේත්‍ර සහ අරමුදල් සපයාගත් ආකාරය කවරේද;

(v) ආයෝජනය කිරීමේදී වෙළඳපොළ සමීක්ෂණයක් සිදු කර තිබේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ව්‍යාපෘතියේ අරමුදල් වැය කිරීම සම්බන්ධයෙන් විගණනයක් සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(iii) ප්‍රසම්පාදන සහ මූල්‍ය මාර්ගෝපදේශ අනුගමනය කර තිබේද;

(iv) නොඑසේ නම්, එම ක්ෂේත්‍ර කවරේද;

(v) කොන්ත්‍රාත්කරුවන්ට සිදු කළ ගෙවීම් පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ව්‍යාපෘතියේ පිරිවැය සහ සමාගමේ වත්කම් සංසන්දනය කිරීමේදී මූල්‍ය අලාභයක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, එය කොපමණද;

(iii) එය සමාගමට දැරිය හැකි මට්ටමක තිබේද;

(iv) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරියෙකු පත් කර තිබේද;

(v) ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක වන්නේද;

(vi) එහි අරමුණු ඉටුවී තිබේද;

(vii) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## **යෝජනා පිළිබඳ දැනුම්දීම**

1\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 2.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2\.

ගරු ඩී.වී. චානක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"ආර්ථික සහ ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියමය,— 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 1(2) වගන්තිය යටතේ එවකට බලශක්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 05 දිනැති අංක 2478/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥාපනත යටතේ නියෝග,— (188 අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47 වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2026 අප්‍රේල් 11 දින සාදන ලදුව, 2026.06.12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*9.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

12.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

13.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

14.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

15.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

“පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

893/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන ‘දීමනා පත්‍ර’ හෝ ‘ඉඩම් බලපත්‍ර’ නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් ඉහත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත්කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

894/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කොරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාලවකවානුව තුළ රජයේ 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

895/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?